**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**----------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

**------**

මෙම වාර්තාවේ 1.3.2, 1.3.3 හා 1.3.5 ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**----------------------**

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සඳහා ලැබී තිබුණු රු. 510,000 ක ගලිබවුසර් ආදායම ලැබිය යුතු ආදායම් ගිණුමට බැර නොකිරීම නිසා වර්ෂය අවසානයට එම අගය තවදුරටත් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ආ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයගැති ශේෂයට ඇතුළත්ව නොතිබුණු ඉදිකිරීමක් සඳහා ලැබී තිබුණු රු. 1,192,271 ක මුදල සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර, විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ දෙකට අදාළ එකතුව රු. 4,183,555 ක් වූ මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ මාස දෙකක මුද්දර ගාස්තු ආදායම් රු. 29,500 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2013 වර්ෂයේදී වියලි කලාපීය උද්භිත උද්‍යානය අසල වාහන නවතා තබන ස්ථානය සකස් කිරීමට අදාළ කර්මාන්තය සඳහා සභාවට ලැබිය යුතු රු. 535,996 ක අතරුදවුම් මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2015 පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ රු. 2,049,788 ක වියදමින් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 9 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායමින් සහ වියදමින් අත්හැරී තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති කොන්ත්‍රාත් තැන්පත්වල වටිනාකම රු. 2,913,587 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 9 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 13,463,162 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

--------------------

සභාව විසින් රැස්කර තිබුණු එකතුව රු. 1,299,728 ක් වූ මුද්දර බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එකතුව රු. 20,835,940 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වලට අදාළ වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛනද, එකතුව රු. 3,102,218 ක් වූ හිඟ වරිපනම් බදු, හිඟ වෙළඳ බලපත්‍ර, හිඟ කඩ කාමර කුලී, හිඟ කර්මාන්ත ණයගැති හා හිඟ දේපල ණය පොලී වලට අදාළ උපලේඛන හා කාල විශ්ලේෂණද, එකතුව රු. 5,760,320 ක් වූ හිඟ මුද්දර ගාස්තු ආදායම් හා අත්තිකාරම් වලට අදාළ ලේඛන, උපලේඛන හා කාල විශ්ලේෂණද, එකතුව රු. 1,225,552 ක් වූ පොදු සැපයුම් ණයහිමියන් හා විවිධ ණයහිමියන්ට අදාළ උපලේඛන හා කාල විශ්ලේෂණද, ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් රු.110,695 ක මුදලක් සභා අරමුදලින් වියදම් කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තිය | යොමුගත විධිවිධාන වලට අනුකූල නොවී පරිවර්තිත ගමන් වියදම් දීමනා ලබා ගන්නා ක්ෂේත්‍ර නිලධාරීන් හතර දෙනෙකු සභාවේ කැබ්රථය භාවිතා කර, ඉන්ධන වෙනුවෙන් රු. 47,721 ක වියදම් දරා තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල්
රෙගුලාසි සංග්‍රහය
-----------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 103,104,105 සහ 110 | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අනතුරු වලට භාජනය වී තිබුණු කැබ් රථයේ හා ගලිබවුසරයේ අලුත්වැඩියාව සඳහා පිළිවෙලින් රු.243,723 ක සහ රු.28,950 ක වියදම් දරා තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(3) | 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අයත් එකතුව රු.2,534,476 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

**1.3.7 බලය නොලත් ගනුදෙනු**
----------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන ප්‍රජා මණ්ඩල දෙකකට ටකරන් මඩු දෙකක් ලබාදීම සඳහා සභා අරමුදලින් රු. 190,900 ක වියදම් දරා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 6,205,097 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 3,633,865 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 9,838,962 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වල අඩුවීමක් පෙන්නුම් කෙරුණු අතර, සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී තිබුණි. වියදම් පාලනය කර අවම මට්ටමකින් පවත්වා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, සමාලෝචිත වර්ෂයේදී ආදායම මෙන් දෙගුණයක් තරම් වියදම් වර්ධනය වී ඇති බවත් නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ වරිපනම් බදු ආදායම රු. 937,460 ක් වූ අතර, වර්ෂය අවසානයට එම අගය රු. 1,213,900 ක් දක්වා වැඩි වී තිබුණි. වරිපනම් බදු අයවීම අවම මට්ටමක පවතින නමුත්, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.2 කඩකුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු. 40,983 ක් වූ අතර, ඉන් රු. 40,483 ක මුදලක් ඉකුත් වර්ෂවලට අදාළ ඒවා විය. එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) සූරියවැව අඩි 100 මාර්ගයේ තිස්සපුර කඩකාමර 12 ක් වෙනුවෙන් තක්සේරු වාර්තා පදනම් කරගෙන කුලී මුදල් අයකර නොතිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු. 736,929 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු ආදායම වර්ෂය අවසානයට රු. 803,979 ක් දක්වා වැඩි වී තිබූ නමුත්, එම ගාස්තු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149,150 හා 152 යන වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.4 සියයට 01 ක බදු මුදල්

-----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයකින් 2012 සැප්තැම්බර් 20 දින සිට 2014 මාර්තු 31 දින දක්වා කාලයට අදාළව අයකල යුතු සියයට 1 ක බදු මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 1,381,995 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 12,041,708 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධන ඇගයීම

වාර්ෂික අයවැය ලේඛනයේ භෞතික සැලසුම්, මංමාවත් , ඉඩම් හා ගොඩනැගිලි යන වැඩසටහන යටතේ රු. 15,800,000 ක ප්‍රාග්ධන ආදායම් හා රු.17,500,000 ක ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කර තිබුණද, එම ප්‍රාග්ධන ආදායම් උපයාගනු ලබන ආකාරය සහ කුමන කාර්යයන් සඳහා ප්‍රාග්ධන වියදම් දරන්නේද යන්න දක්වා නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභිකයින්ගේ රාජකාරී කටයුතු සඳහා රජය විසින් සහනදායී පදනම මත යතුරුපැදි සහ මසකට රු. 3,000 බැගින් ඉන්ධන දීමනා ලබා දී තිබුණු නමුත්, සභිකයින් පස් දෙනෙකුට අවස්ථා 42 කදී සභාවේ කැබ් රථය ලබා දී රු. 101,471 ක ඉන්ධන වියදම් දරා තිබුණි.

## 3.3 අංක PF - 3363 දරන කැබ් රථයේ ඉන්ධන භාවිතය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඉන්ධන ටැංකියේ ධාරිතාවය ලීටර් 80 ක් වුවත්, එම ප්‍රමාණය ඉක්මවමින් 2015 ජනවාරි සිට අප්‍රේල් 30 දක්වා කාලය තුළ අසාමාන්‍ය ලෙස ටැංකියේ ඉන්ධන ඉතිරිව ඇති බව ධාවන සටහන්පත් අනුව තහවුරු විය. එම ප්‍රමාණයන් ලීටර් 88 සිට ලීටර් 136 දක්වා වූ පරාසයක විය.

(ii) අවශ්‍ය ප්‍රමාණයන් හඳුනා නොගෙන කැබ් රථයේ ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා ඉන්ධන ලීටර් 1777.3 ක් මිලදී ගැනීම සඳහා රු. 205,471 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) 2015 මාර්තු 11 දිනැති අංක හපපා/ඒ/වාහන/පොදු දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය අනුව ලීටරයට කිලෝ මීටර් 9 ක් ලෙස ඉන්ධන තුලනය කිරීමට නිර්දේශ ලබා දී තිබූ නමුත්, ඊට අනුකූල නොවී ලීටරයට කිලෝ මීටර් 8 ක් බැගින් වන පරිදි ඉන්ධන තුලනය කිරීම නිසා ඉන්ධන ලීටර් 383 ක් සඳහා රු. 36,385 ක මුදලක් වැය කර තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### විදුලි උපකරණ මිලදී ගැනීම

සභාව විසින් වීථි පහන් නඩත්තු කිරීම සඳහා වර්ෂය තුළ අවස්ථා හතරකදී එකතුව රු.512,000 ක වියදමින් වොට් 23 ප්‍රමාණයේ CFL බල්බ 1600 ක් මිලදී ගෙන තිබුණි. CFL බල්බ සඳහා වගකීම් කාලයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ මාරුකර ගැනීමට කටයුතු නොකර අලුතින් මිලදී ගැනීම නිසා අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

සභාවට අයත් ට්‍රැක්ටර් රථ 03 ක් සඳහා වැසි ආවරණ වහලයන් සකස් කිරීමට අවස්ථා දෙකකදී එකතුව රු.150,140 ක මුදලක් ගෙවා තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය ප්‍රකාර මෙවැනි කාර්යයන් සඳහා වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය භාවිතා කළ හැකි වුවත්, එසේ නොකර ජාතික තරඟකාරී ලංසු කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු.48,266 ක් වැයකර තිබුණි.

## 3.6 හඳුනාගත් අලාභ

------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු. 30,000 ක වියදමින් ලබා දී තිබුණු ලීටර් 2000 ප්‍රමාණයේ ප්ලාස්ටික් ජල ටැංකිය 2015 නොවැම්බර් මස 24 දින අස්ථානගත වීම සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ මුරකරු, වගකීම භාරගෙන තිබූ නමුත්, අදාළ මුදල අයකර ගැනීමට 2016 මැයි 17 දින දක්වා ප්‍රමාද වී තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2015**

----------------------------------------------------

යොමුගත වැඩසටහන යටතේ රු. 1,000,000 ක් වූ පළමු වාරිකය 2015 ජුනි 17 දින ලැබී තිබූ අතර, නියමිත පරිදි වියදම් කිරීමට 2016 ජනවාරි 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි. එම හේතුව නිසා 2015 අප්‍රේල් 28 දිනැති අංක 1/2015 දරන පළාත් පාලන චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා ලබා ගැනීමට හැකිව තිබූ රු. මිලියන 5 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

**(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2014**

----------------------------------------------------

යොමුගත වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 08 ක් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර නිමකර තිබියදීත් බිල්පත් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 3,973,017 ක මුදලක් 2016 ජනවාරි 14 දින වන විටත් සභාවට ලැබී නොතිබුණි. 2016 අගෝස්තු 22 දින වන විට ඉන් රු. 1,267,480 ක් ප්‍රතිපූර්ණය වී ඇති බව ලේකම්වරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.

## 3.8 කාර්යය මණ්ඩල කළමනාකරණය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත තනතුරු පහක පුරප්පාඩු අටක් පැවති අතර, සේවකයන් පස් දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට සහ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙහි වියදම් විෂයයන් 62 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,641,200 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 29 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.4,534,250 ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ළඟාකර නොගත් එකතුව රු.43,201,479 ක් වූ ඉලක්කයන්ද, නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපප/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 බේරුම් නොකළ බැරකම්

-----------------------------

ශේෂපත්‍රයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු. 2,526,265 ක් වුවද, එදිනට නිවැරදි ණයහිමි ශේෂය රු. 8,514,759 ක් විය. එම ශේෂයට ඉකුත් වර්ෂයට අදාළ රු. 5,234,244 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය.
(ඇ) ආදායම් පරිපාලනය.
(ඈ) වත්කම් කළමනාකරණය.
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය.